සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

| | | |
|---|---|---|
| ඉස්ලාම් ශිෂ්ටාචාරය I<br>இஸ்லாமிய நாகரிகம் I<br>Islamic Civilization I | 47 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
※ උත්තර පත්‍රයේ පසුපිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (×) **යොදා දක්වන්න.**

**1.** ඉස්ලාම් ශිෂ්ටාචාරය සම්පූර්ණ වූවකි යන්න හඟවන ලද අවස්ථාව වන්නේ,
(1) හුදෙයිබියියා සම්මුතියයි. (2) හජ්ජතුල් වදා ය.
(3) හන්දක් යුද්ධයයි. (4) මක්කා ජයග්‍රහණයයි.
(5) මදීනා ශාසනයයි.

**2.** ජාහිලියියා සමාජයේ එකිනෙක ගෝත්‍රයන් තමාට ආවේණික කුල දෙවිවරු තබාගෙන සිටියහ. කුල දෙවි වන්දනාව සිදු කළ පූජකයා වන්නේ,
(1) ආලිම් ය. (2) ජාහිල් ය. (3) කාමිල් ය. (4) කාහින් ය. (5) ආදිල් ය.

**3.** අල්-කුර්ආනයේ අන්තර්ගත වී ඇති ප්‍රධාන විෂය ක්ෂේත්‍රය
(1) ඉතිහාසය වේ. (2) නීති වේ. (3) විද්‍යාව වේ.
(4) පාරිශුද්ධ භාවය වේ. (5) ඇදහීමේ පිළිවෙත් වේ.

**4.** නබි (සල්) තුමාට ලිපියක් ලියා නබිත්වයට උරුමකම් ඉල්ලූ තැනැත්තා වන්නේ,
(1) අස්වද් අන්සි ය. (2) සජා ය. (3) මුසෛලමා ය.
(4) තුලෛහා බින් කුවෛලිද් ය. (5) මාලික් බින් දුවෛරා ය.

**5.** පහත සඳහන් දෑ අතුරෙන් සූෆි චින්තනය පදනමෙන් බිහි වූ තෆ්සීර් ග්‍රන්ථය කුමක් ද?
(1) තෆ්සීර් ඉබ්නු කසීර් (2) ජාමිඋල් බයාන් (3) මෆාතිහුල් ගෛබ්
(4) හකාඉගුත් තෆ්සීර් (5) තෆ්සීර් ජලාලෛන්

**6.** සිත පිරිසිදු කිරීමටත් දේව සබඳතාව ඇති කරගැනීමටත් වන ඉස්ලාමික මාර්ගය
(1) වුජූද් ය. (2) විලායත් ය. (3) සුහ්ද් ය. (4) දික්ර් ය. (5) මුරීද් ය.

**7.** ශාසාහි ඉපදී ඉස්ලාමීය නීති ක්ෂේත්‍රයේ වර්ධනයට දායක වූ විද්වතා වන්නේ,
(1) ඉමාම් අබූ හනීෆා (රහ්) ය. (2) ඉමාම් මාලික් (රහ්) ය.
(3) ඉමාම් ෂාෆිඊ (රහ්) ය. (4) ඉමාම් අහ්මද් බින් හන්බල් (රහ්) ය.
(5) ඉමාම් නවවි (රහ්) ය.

**8.** ස්වාමිපුරුෂයා සහ භාර්යාවට වෙන් කරන ලද යුතුකම් අතුරෙන් භාර්යාවගේ යුතුකමක් **නොවන්නේ** කුමක් ද?
(1) ආදරයෙන් රැක බලාගැනීම ය. (2) විශ්වාසවන්තව සිටීම ය.
(3) අවශ්‍යතා හඳුනාගෙන කටයුතු කිරීම ය. (4) ළමයින් හදාවඩා ගැනීම ය.
(5) පවුලට වියදම් කිරීම ය.

**9.** පැරණිතම ශිෂ්ටාචාරය වන්නේ,
(1) ඊජිප්තු ය. (2) මෙසපොතේමියා ය. (3) සින්ද් ය.
(4) රෝම ය. (5) ග්‍රීක ය.

[දෙවැනි පිටුව බලන්න.

Past Papers Wiki



**10.** 'අස්සලාත් වමකාසිදූහා' යනු
(1) නීති නියමයක් ය. (2) ග්‍රන්ථයක් ය. (3) ඇදහිලි ක්‍රමයක් ය.
(4) නීති මූලාශ්‍රයක් ය. (5) ඓතිහාසික සිද්ධියක් ය.

**11.** 'තජ්දීද්' යන්නෙහි අදහස කුමක් ද?
(1) ඉවත් කිරීම (2) වෙනස් කිරීම (3) බිහි කිරීම
(4) අත්හැරීම (5) නිවැරදි කිරීම

**12.** මුඃතසිලාවරුන්ගේ උපකොටස්වලින් එකක් වනුයේ,
(1) වාසිතියියා ය. (2) වාසිලියියා ය. (3) බාතිනියියා ය.
(4) වහ්දානියියා ය. (5) ජහ්මියියා ය.

**13.** පහත සඳහන් කරුණු සලකන්න.

A - ශ්‍රී ලංකාවේ පිහිටීම
B - ශ්‍රීපාද කන්ද
C - අරාබිවරුන්ගේ ආක්‍රමණය
D - වරාය පහසුකම්
E - මුහුදු වෙළඳ මාර්ගය

ඉහත සඳහන් කරුණු අතුරෙන් අරාබියාව හා ශ්‍රී ලංකාව අතර පැවති පැරණිතම සබඳතා හා සම්බන්ධ කරුණු පමණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) A, B, C, D (2) A, B, C, E (3) A, B, D, E (4) A, C, D, E (5) B, C, D, E

**14.** සමාජ සංවර්ධන ක්‍රියාවල යෙදීම පහත දැක්වෙන කුමන මට්ටමට අයත් වේ ද?
(1) ළරූරියියාත් (2) හාජියාත් (3) තහ්සීනියාත්
(4) ජිබිල්ලියාත් (5) තහ්රීමාත්

**15.** පහත වගුවේ දී ඇති තොරතුරු සලකන්න.

| අල්-කුර්ආන් හා සම්බන්ධ කාර්යයන් | කාලසීමාව |
|---|---|
| (i) අල්-කුර්ආන් පහළ කිරීම | A - තාබිඊන්වරුන්ගේ සමය |
| (ii) අල්-කුර්ආන් ග්‍රන්ථකරණය | B - නවීන සමය |
| (iii) අල්-කුර්ආන් ඩිජිටලීකරණය | C - සහාබිවරුන්ගේ සමය |
| (iv) අල්-කුර්ආන් වචනවලට සංකේත යෙදීම | D - වර්තමානය |
| (v) අල්-කුර්ආන් මුද්‍රණය කිරීම | E - නබි (සල්) තුමාගේ සමය |

ඉහත වගුවේ සඳහන් අල්-කුර්ආන් හා සම්බන්ධ කාර්යන්වල පිළිවෙළට අනුව එහි කාලවකවානුව නිවැරදි අනුපිළිවෙළින් දක්වා ඇති වරණය කුමක් ද?
(1) A, E, D, B, C (2) B, D, A, E, C (3) C, D, A, E, B
(4) D, A, B, E, C (5) E, C, D, A, B

**16.** පහත වගුවේ දී ඇති තොරතුරු සලකන්න.

| ප්‍රසිද්ධ පුද්ගලයින් | දක්වන ලද දායකත්වය |
|---|---|
| (i) ජවුෆර් සාදික් (රහ්) | A - අල්-ඉබානා අල්-උසූලුද්දියානා යන ග්‍රන්ථ කර්තෘත්වය |
| (ii) අබුල් හසන් අල්අෂ් අරි (රහ්) | B - ෂීආ ඉමාමත් සංකල්පය |
| (iii) අලි බින් තබරීස් (රහ්) | C - අල්-කුර්ආනය පිටපත් කර විකිණීම |
| (iv) අබූ හාමිද් අල් ගස්සාලි (රහ්) | D - නස්තලික් ලේඛන කලාව හඳුන්වා දීම |
| (v) අවුරංගසීප් (රහ්) | E - 'අස්සිමා' සංගීත ක්ෂේත්‍රය ග්‍රන්ථ කර්තෘත්වය |

ඉහත වගුවේ සඳහන් විද්වතුන්ගේ පිළිවෙළට අනුව ඔවුන් දක්වන ලද දායකත්වය නිවැරදි අනුපිළිවෙළින් දක්වා ඇති වරණය කුමක් ද?
(1) A, B, C, D, E (2) A, B, D, E, C (3) B, A, C, E, D
(4) B, A, D, E, C (5) B, D, A, E, C

**17.** පහත සඳහන් වගුවේ දී ඇති තොරතුරු සලකන්න.

| අල්-කුර්ආන් වැකි | විදහා දක්වනු ලබන කරුණ |
|---|---|
| (i) ඔබව එක් ආත්මයකින් බිහි කළේ ය. | A - සරල ධර්මයකි |
| (ii) ස්ත්‍රීන්ව නඩත්තු කරන්නේ පිරිමි ය. | B - ආගමික නිදහස |
| (iii) අල්ලාහ් කිසිම ආත්මයකට දැරිය නොහැකි දුෂ්කරතා දී නැත. | C - දේපළ හිමිකම |
| (iv) පිරිමින්ට ඔවුන්ගේ ඉපයීම්වල නියමිත හිමිකම ඇත. එලෙසම ස්ත්‍රීන්ටත් ඔවුන්ගේ ඉපයීම්වල නියමිත හිමිකම ඇත. | D - ස්ත්‍රී-පුරුෂ සබඳතාවය |
| (v) ඔබේ දහම ඔබට අයිති ය. මගේ දහම මට අයිති ය. | E - පවුලේ මූලිකත්වය |

ඉහත වගුවේ දී ඇති අල්-කුර්ආන් වැකිවල පිළිවෙළට අනුව එමගින් විදහා දක්වන කරුණු නිවැරදි අනුපිළිවෙළින් දක්වා ඇති වරණය කුමක් ද?

(1) A, B, C, D, E  (2) B, C, D, A, E  (3) C, D, A, E, B
(4) D, E, A, C, B  (5) E, B, D, C, A

**18.** හදීස් ප්‍රභේදවලින් 'අල්-මශ්හූර්' යනු,
(1) හොඳින් ප්‍රචලිත වූ හදීස් ය.
(2) දැනුම්දෙන්නන් මාර්ග දෙකකින් යුක්ත හදීස් ය.
(3) බොහෝ දැනුම්දෙන්නන්ගේ මාර්ගයෙන් යුක්ත හදීස් ය.
(4) සහාබිගේ ප්‍රකාශ ලෙස පවතින හදීස් ය.
(5) දැනුම්දෙන්නන් බණ්ඩනයව පවතින හදිස් ය.

**19.** පහත ඒවා අතුරෙන් ඉස්ලාම් ශිෂ්ටාචාරය පිළිබඳව පෙරදිග පර්යේෂකයින් ඉදිරිපත් කරන ලද විවේචනය කුමක් ද?
(1) දේවමය මඟපෙන්වීම් සහිත ය.
(2) තර්කාන්විත වූවකි.
(3) විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කරයි.
(4) මුස්ලිම් පාලනයෙහි ප්‍රතිඵලයකි.
(5) රජය ආගමෙන් වෙන් කරයි.

**20.** ඉස්ලාමීය දෘෂ්ටිකෝණයෙන් සමාජ විද්‍යාවේ ප්‍රධාන විෂය ක්ෂේත්‍රය වන්නේ කුමක් ද?
(1) මිනිසා  (2) සමාජය  (3) ආගම  (4) සංස්කෘතිය  (5) ශිෂ්ටාචාරය

**21.** සහීහ් වර්ගයේ හදීස් ග්‍රන්ථයක විශේෂ ලක්ෂණය
(1) ප්‍රචලිත හදීස්වලින් යුක්ත ය.
(2) සාක්ෂි සහිත හදීස්වලින් යුක්ත ය.
(3) නීති හා සම්බන්ධ වූ හදීස්වලින් යුක්ත ය.
(4) මුතවාතිර් වූ හදීස්වලින් යුක්ත ය.
(5) හදීස් කුද්සි වර්ගයෙන් යුක්ත ය.

**22.** 'වහී' යන්න ඥානයේ මූලයක් වශයෙන් ක්‍රියාකරනු ලබන්නේ,
(1) තර්කාන්විතව ය.  (2) සංජානනයක් ලෙස ය.
(3) අත්දැකීම් ඥානයක් ලෙස ය.  (4) පහළ කරන ලද ඥානයක් ලෙස ය.
(5) දාර්ශනික ඥානයක් ලෙස ය.

**23.** සමාජ සුබසිද්ධිය හා එහි වර්ධනයෙහි නිරතවීම පිළිබඳ ඉස්ලාමීය ස්ථාවරය කුමක් ද?
(1) වාජිබ්  (2) මුබාහ්  (3) සුන්නත්  (4) ෆර්ලු කිෆායා  (5) මුස්තහබ්

**24.** "ඔබගේ අධිපති අපේක්ෂා කළේ නම් භූමියෙහි සිටින සියලුදෙනා ඊමාන්ධාරීන් වන්නට තිබුණා" යන අල්-කුර්ආන් වාක්‍යයෙහි අර්ථය කුමක් ද?
(1) ඉස්ලාම් උසස් වූ ධර්මයකි.
(2) සියලු ම ආගම් සමාන ය.
(3) බොහෝ ආගම්වල පැවැත්ම ස්වාභාවික ය.
(4) ආගම් එකිනෙක ගැටීම්වලින් යුක්ත ය.
(5) ආගමික වෙනස්කම් නොවැළැක්විය හැක්කකි.

Past Papers Wiki



**25.** පහත දෑ අතුරෙන් ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරු පිළිබඳ **නොගැළපෙන** පිළිතුර තෝරන්න.
(1) ජාතික ආරක්ෂාවට හා සුරක්ෂිතතාවයට දායකත්වය සැපයූහ.
(2) සිංහල රජවරු හා සම්බන්ධ වී යටත් විජිතවාදයට එරෙහිව යුද වැදුනහ.
(3) ශ්‍රී ලංකාවේ යුනානි වෛද්‍ය ක්‍රමය හඳුන්වා දුන්හ.
(4) රජවරුන්ගේ රාජ්‍ය තාන්ත්‍රිකයන් ලෙස කටයුතු කළහ.
(5) අරාබි භාෂාව මව් භාෂාව ලෙස භාවිත කළහ.

**26.** හදීස් එක් රැස්කර, ග්‍රන්ථ සම්පාදනයට රාජ්‍ය අනුග්‍රහය ලබා දුන් උමයියා පාලකයා වන්නේ,
(1) අබ්දුල් මලික් බින් මර්වාන් ය.
(2) සුලෛයිමාන් බින් වලීද් ය.
(3) වලීද් බින් අබ්දුල් මලික් ය.
(4) උමර් බින් අබ්දුල් අසීස් ය.
(5) මර්වාන් බින් හකම් ය.

**27.** ඉස්ලාම් යනු 'රහ්මතුන් ලිල් ආලමීන්' යනුවෙන් සඳහන් වේ. 'රහ්මතුන් ලිල් ආලමීන්' යන්නෙහි අර්ථය කුමක් ද?
(1) ලෝකයට මඟපෙන්වීමක්
(2) ලෝකයට ආශීර්වාදයක්
(3) ලෝකයට ධර්මයක්
(4) ලෝකයට ප්‍රාතිහාර්යයක්
(5) ලෝකයට සාමය

**28.** අරාබියාවේ පළමු යුදෙව් ජනාවාස බිහි වූයේ කුමන අවස්ථාවේ දී ද?
(1) රෝමානුවන් පලස්තීනය ජයග්‍රහණය කළ අවස්ථාවේ දී
(2) මුස්ලිම්වරු ඊජිප්තුව ආක්‍රමණය කළ අවස්ථාවේ
(3) මක්කා ජයග්‍රහණය සිදු වූ විට
(4) රෝමානුවන් උතුරු අප්‍රිකාව ජයග්‍රහණය කළ අවස්ථාවේ දී
(5) මුස්ලිම්වරුන්ගේ පර්සියානු ජයග්‍රහණයේ දී

**29.** නබි(සල්) තුමාට මුල් අවස්ථාවේ පහළ කරන ලද වහි සහ එතුමාගේ ප්‍රචාරණයන්හි අන්තර්ගත වූ විෂයන් මොනවා ද?
(1) කිලාෆත්, විලායත්, ඉබාදත් ය.
(2) තෞහීද්, රිසාලත්, මආද් ය.
(3) සලාත්, සකාත්, මආද් ය.
(4) මආද්, සදකා, සකාත් ය.
(5) රිසාලත්, ඉබාදත්, ඉමාරත් ය.

**30.** ජාහිලියියා සමයේ ගද්‍ය සාහිත්‍යය වර්ධනය මන්දගාමී වීමට හේතු වූ කරුණක් **නොවන්නේ,**
(1) මතක ශක්තිය අඩුව තිබීමයි.
(2) නිසදැස්වලට උනන්දුව දැක්වීමයි.
(3) ලිවීමේ හා කියවීමේ දැනුම ප්‍රමාණවත් නොවීමයි.
(4) අක්ෂර හැඩයන් සම්පූර්ණ වී නොතිබීමයි.
(5) ලිවීමේ උපකරණ භාවිත නොකිරීමයි.

**31.** 'ඉෂාරතුන්නස්' යනු,
(1) පැහැදිලි නීති විනිශ්චයකි.
(2) නීති සම්පාදන අනුපිළිවෙළකි.
(3) පැහැදිලි නීති විනිශ්චයන්ගෙන් ලබා ගැනෙන අනෙකුත් තීරණයන් වේ.
(4) නීති විද්‍යාත්මක ප්‍රවේශය වේ.
(5) උලමාවරුන්ගේ නිගමනයන් වේ.

**32.** පහත සඳහන් කරුණු සලකන්න.
A - මිනිසාව සදාචාරාත්මක කරයි.
B - දේවත්ව හැඟීම ලබාදෙයි.
C - ආචාරධර්ම පදනම් වූ ජීවිතය පිළිබඳ උගන්වයි.
D - හෘද සාක්ෂිය වර්ධනය කරයි.
E - ලෞකික පහසුකම් වර්ධනය කරයි.

ඉහත සඳහන් කරුණු අතුරෙන් ආගමක අවශ්‍යතාව සහතික කරන කරුණු පමණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) A, B, C, D (2) A, B, C, E (3) A, B, D, E (4) A, C, D, E (5) B, C, D, E

**33.** ෂරීආ යන පදයේ අර්ථය **නොවන්නේ,**
(1) උල්පත ය.
(2) පැහැදිලි කිරීම ය.
(3) කැමැත්ත ය.
(4) පැහැදිලි මාර්ගය ය.
(5) ආරම්භය ය.

**34.** ඉස්ලාමික ආර්ථික න්‍යායේ පොලිය තහනම් කිරීමට ප්‍රධාන හේතුව කුමක් ද?
(1) වියදම් සීමා කිරීමයි. (2) ඉතිරිකිරීම් දිරිගැන්වීමයි.
(3) දරිද්‍රතාවය තුරන්කිරීමයි. (4) දේපළ හිමිකම ප්‍රතික්ෂේප කිරීමයි.
(5) ආර්ථික කටයුතු වර්ධනය කිරීමයි.

**35.** ෂරීආ සහ ෆික්හ් පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) ෆික්හ් තුළ ෂරීආ ඇතුළත් ය.
(2) ෂරීආ යන්න ෆික්හ් පාදක කරගෙන ඇත.
(3) ෂරීආ යන්න ෆික්හ්ට වඩා පුළුල් ය.
(4) ෂරීආ දේව කැමැත්ත සහ ෆික්හ් නීති සම්පාදනය සංකේතවත් කරයි.
(5) ෆික්හ් නීති පමණක් ද ෂරීආ එහි මූලාශ්‍ර ද සංකේතවත් කරයි.

**36.** ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය පිළිබඳ ඉස්ලාම් දෘෂ්ටිකෝණය කුමක් ද?
(1) පුරුෂයා උසස් ය.
(2) ස්ත්‍රිය උසස් ය.
(3) පුරුෂයා හා ස්ත්‍රිය සමාන ය.
(4) දෙපාර්ශ්වය ම වෙන් වෙන් වූ වගකීම් දරන්නන් ය.
(5) දෙපාර්ශ්වය ම සමාන නොවේ.

**37.** ඉන්දීය උපමහද්වීපයේ **බිහි නොවූ** ඉස්ලාමීය ප්‍රතිසංස්කරණවාදී ව්‍යාපාරය වන්නේ,
(1) තබ්ලීක් ජමා අත් ය. (2) ජමා අතේ ඉස්ලාමී ය.
(3) ඉඃවාන් අල් මුස්ලිමීන් ය. (4) දේව් බන්දි ව්‍යාපාරය ය.
(5) අලිගාර් ව්‍යාපාරය ය.

**38.** පහත ඉස්ලාමීය පදනම් සලකන්න.
A - සියලුදෙනා අල්ලාහ්ගේ මැවීම් වේ.
B - සියලුදෙනා ආගම් සහ ප්‍රතිපත්ති තෝරාගැනීමේ නිදහස තිබෙන අය වේ.
C - සියලුදෙනා පෞද්ගලික අනන්‍යතාවයන් අත්හැරීමට අවශ්‍ය අය වේ.
D - සියලුදෙනා එකිනෙකාට උදව් කරගත යුතු අය වේ.
E - සියලුදෙනා නීතිය ඉදිරියේ සමානවූවන් වේ.
F - සියලුදෙනා භාෂාව හා සංස්කෘතික වෙනස්කම් සහිත අය වේ.
ඉහත සඳහන් ඒවායින් බහු ආගමික, සමාජය හා එකට ජීවත්වීම සහ එක්ව කටයුතු කිරීම සම්බන්ධ වූ ඉස්ලාමීය පදනම් පමණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) A, B, C, D, E. (2) A, B, C, E, F. (3) A, B, D, E, F.
(4) A, C, D, E, F. (5) B, C, D, E, F.

**39.** පහත සඳහන් කරුණු සලකන්න.
A - ප්‍රතිපත්ති පිළිබඳ නිදහස සහ චින්තනයන්ගේ වර්ධනය
B - දේශපාලන ගැටීම් හා බෙදීම්
C - මුස්ලිම්වරුන්ගේ ආගමික බැඳීම සහ ඊමාන් පිළිබඳ හැඟීම්
D - අන්‍ය සංස්කෘතික මිශ්‍රණය සහ ආධිපත්‍යය
E - විදේශ ආක්‍රමණයන් සහ ජයග්‍රහණයන්
ඉහත සඳහන් ඒවායින් ඉස්ලාම් සංස්කෘතිය සහ ශිෂ්ටාචාරය ආදියෙහි මන්දගාමී තත්ත්වයක් ඇතිවීමට තුඩුදුන් කරුණු පමණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) A, B, C, D (2) A, B, C, E (3) A, B, D, E (4) A, C, D, E (5) B, C, D, E

**40.** විජයබාහු රජු සිංහාසනාරූඪ කිරීමේ උත්සවයේ දී අනුග්‍රාහීව කටයුතු කළ මුස්ලිම් ප්‍රධානියා වන්නේ,
(1) අබූ උස්මාන් ය. (2) ෂෙයික් ආලිම් ය.
(3) පෙරිය තම්බි මරික්කාර් ය. (4) කාලිද් බින් අබූ බකායා ය.
(5) ෂෙයික් අබ්දුල් කාදර් ය.

PAST PAPERS WIKI

● පහත දැක්වෙන්නේ ඉස්ලාම් ඉතිහාසයේ බිහි වූ කණ්ඩායම් වේ. ඒවා පදනම් කොටගෙන **41** සිට **45** දක්වා වූ ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| A - ඉස්මාඊලියියා | F - හාතිබියියා | K - නුසයිරියියා |
| B - කදරියියා | G - අයියූබියියා | L - ජහ්මියියා |
| C - ශමාමියියා | H - ජබරියියා | M - නක්ෂබන්දියියා |
| D - ශෛදියියා | I - සෙල්ජූකියියා | N - ෆාතිමියියා |
| E - ෂාධුලියියා | J - හිෂාමියියා | O - කාදිරියියා |

**41.** මුඃතසිලා ප්‍රතිපත්තිය සහිත කණ්ඩායම් ඇතුළත් වරණය කුමක් ද?
(1) A, B, C (2) B, C, J (3) C, D, J (4) C, F, J (5) F, J, L

**42.** ෂීයා කණ්ඩායම් ඇතුළත් වරණය කුමක් ද?
(1) A, B, E (2) A, D, K (3) B, C, K (4) B, D, F (5) D, F, K

**43.** අකීදාහි විරුද්ධ වූ කණ්ඩායම් ඇතුළත් වරණය කුමක් ද?
(1) A, C, F (2) B, H, L (3) C, D, J (4) C, H, K (5) D, F, J

**44.** සූෆි තරීකා කණ්ඩායම් ඇතුළත් වරණය කුමක් ද?
(1) A, B, F (2) C, H, O (3) D, K, M (4) E, M, O (5) L, M, N

**45.** කුඩා රාජ්‍යයන් බිහිකළ කණ්ඩායම් ඇතුළත් වරණය කුමක් ද?
(1) B, F, J (2) C, I, K (3) F, G, L (4) G, H, O (5) G, I, N

● **46** සිට **50** දක්වා සෑම ප්‍රශ්නයකට ම ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එම යුගලයන් සම්බන්ධ වඩාත් ගැළපෙන සම්බන්ධතාවය පෙන්වන නිවැරදි පිළිතුර පහත සඳහන් වගුවේ අංක (1), (2), (3), (4), (5) අංකවලින් තෝරන්න.

| අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| (1) | නිවැරදි ය. | නිවැරදි ය. |
| (2) | වැරදි ය. | නිවැරදි ය. |
| (3) | නිවැරදි ය. | වැරදි ය. |
| (4) | වැරදි ය. | වැරදි ය. |
| (5) | නිවැරදි ය. | නිවැරදි වන අතර පළමු ප්‍රකාශය තවදුරටත් විස්තර කරයි. |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| **46.** | බහු ආගමික විවිධත්වය යනු දේව කැමැත්ත වේ. | ආගමික නිදහස යනු ඉස්ලාම්හි මූලික සංකල්පය වේ. |
| **47.** | ඉස්ලාම් ෂරීආ නීති සියල්ල අරමුණු සහිත ඒවා ය. | මදීනාහි ඇති වූ සාගත තත්ත්වය යටතේ සොරකම් සඳහා දඬුවම් අත්හිටුවන ලදී. |
| **48.** | ඉබන් බතූතා මෙහි පැමිණි විට පණ්ඩුකාභය රජු අනුරාධපුරය පාලනය කළේ ය. | ඉබන් බතූතාගේ පැමිණීමේ දී ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් එක් සමාජයක් ලෙස ජීවත් වූහ. |
| **49.** | අබ්බාසි පාලනය විසින් ඉස්ලාම් අධිරාජ්‍යයේ සීමාව ව්‍යාප්ත කරන ලදී. | උමෙයියා පාලකයින් ඉස්ලාම් අධිරාජ්‍යයේ විවිධ ප්‍රදේශවල පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවී ය. |
| **50.** | හුදෛබියා සම්මුතිය එකළ මුස්ලිම් සමාජයට දේශපාලන පිළිගැනීමක් ලබා දුන්නේ ය. | 'හුදෛබියා' යනු මුස්ලිම්වරුන් සහ යුදෙව් ගෝත්‍රිකයන් අතර වූ සම්මුතියකි. |

* * *

0143

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

ඉස්ලාම් ශිෂ්ටාචාරය II
இஸ்லாமிய நாகரிகம் II
Islamic Civilization II

47 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

※ **I කොටසින්** ප්‍රශ්න **දෙකක්** ද, **II කොටසින්** ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. (i) රිසාලත් සහ කිලාෆත් අතර වෙනස්කම් **හතරක්** සඳහන් කරන්න.
   (ii) ආහාද් හදීස්වලින් 'හදීස් ගරීබ්' යන්න වෙන් කර දක්වන්න.
   (iii) 'අල්-මුජ්තහිද් මුත්ලක් අල්-මුන්තසිබ්' යන්න අර්ථ දක්වන්න.
   (iv) 'තජ්දීද්' යන්නෙහි අර්ථය කෙටියෙන් පැහැදිලි කරන්න.
   (v) තෆ්සීර් හා තඃවීල් යන්නෙහි සබඳතාවය දක්වන්න.

(ලකුණු 04 × 5 = 20 යි)

2. (i) ඉස්ලාම් දහම විසින් වෙනස් කරන ලද ජාහිලියියා සමාජ ක්‍රම **හතරක්** කෙටියෙන් පැහැදිලි කරන්න.
   (ii) නබි (සල්) තුමාගේ සමයේ සිදු වූ දේශපාලන ගිවිසුම් **දෙකක්** විස්තර කරන්න.
   (iii) විද්‍යා හා තාක්ෂණයෙහි වර්ධනයට අබ්බාසි පාලකයන්ගේ දායකත්ව **හතරක්** කෙටියෙන් පැහැදිලි කරන්න.
   (iv) යුරෝපයට ඉස්ලාම් ධර්මය හඳුන්වාදීම සඳහා හේතු වූ කරුණු **හතරක්** කෙටියෙන් පැහැදිලි කරන්න.
   (v) ප්‍රධාන මුස්ලිම් කුඩා රාජ්‍යයන් **හතරක්** පිළිබඳ විස්තර කරන්න.

(ලකුණු 04 × 5 = 20 යි)

3. (i) 'ඉමාරත්' යන්න පරිසර ආරක්ෂාව හා සම්බන්ධ කොට උදාහරණ **දෙකක්** සපයන්න.
   (ii) පවුල, නෑදෑයින් සහ අසල්වැසියන් යන සබඳතා පිළිබඳ ඉස්ලාමීක අගයන් පැහැදිලි කරන්න.
   (iii) මකාසිද් ෂරිආ හි පියවර විද්‍යා දක්වන අයුරෙන් නිදසුන් **හතරක්** දක්වන්න.
   (iv) විශ්වය මැවීමට තුඩුදුන් හේතු **හතරක්** පැහැදිලි කරන්න.
   (v) අයිෂා (රලි) තුමියගේ විශේෂ ලක්ෂණ **හතරක්** විස්තර කරන්න.

(ලකුණු 04 × 5 = 20 යි)

[දෙවැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

## II කොටස

4. (i) "මැදපෙරදිග රටවල් හා ශ්‍රී ලංකාව අතර පැවති පැරණි සබඳතා ඉස්ලාම්හි පැතිරීමට හේතු විය." මෙම ප්‍රකාශයේ යෝග්‍යතාව කරුණු **පහක්** පාදක කරගනිමින් පැහැදිලි කරන්න.

(ii) බෛතුල් මක්දිස් මුදවා ගැනීමට අයියූබි පාලනයේ දායකත්වය විස්තර කරන්න.

(ලකුණු 10 × 2 = 20 යි)

5. (i) මිනිසා මැවීමේ අරමුණු පිළිබඳ ඉස්ලාමික මත **පහක්** විස්තර කරන්න.

(ii) අනෙකුත් සමාජයන් සමග මුස්ලිම්වරුන්ගේ යහසබඳතාවයන් පිළිබඳ ඉස්ලාමීය ඉගැන්වීම්වලින් කරුණු **දහයක්** විස්තර කරන්න.

(ලකුණු 10 × 2 = 20 යි)

6. (i) තාරකා ශාස්ත්‍රයේ වර්ධනයට මුස්ලිම්වරුන්ගේ දායකත්වය අගය කරන්න.

(ii) ඉමාම් ගස්සාලි (රහ්) තුමා සහ ෂෙයික් අහ්මද් සිර්හින්දි (රහ්) තුමාගේ ආගමික පුනරුද චින්තනයන් සංසන්දනාත්මකව පැහැදිලි කරන්න.

(ලකුණු 10 × 2 = 20 යි)

7. (i) "ඉස්ලාම් යනු ආගම සහ සමාජය සම්බන්ධ වූවකි." මෙම ප්‍රකාශය සුදුසු කරුණු **පහක්** පාදක කරගෙන සාධාරණීකරණය කරන්න.

(ii) සමාජය ගොඩනැගීමේ දී ස්ත්‍රීන්ගේ දායකත්වය විදහා දක්වන පරිදි ඉස්ලාම් ඉදිරිපත් කරන කරුණු **පහක්** විස්තර කරන්න.

(ලකුණු 10 × 2 = 20 යි)

8. (i) "ඉස්ලාම් දහමෙහි සම්භවන සමයේ මුස්ලිම්වරුන්ගේ ජීවිතය, සුන්නාව පිළිබිඹු කරන ආකාරයෙන් සමන්විත විය." පැහැදිලි කරන්න.

(ii) ඉමාම් ෂාෆිඊ (රහ්) තුමාගේ ජීවිතය හා සේවාවන් පිළිබඳ විස්තර කරන්න.

(ලකුණු 10 × 2 = 20 යි)

* * *

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library